# අපේ දහම් පාසල



## 1 ශ්‍රේණිය



# දහම් පාසල

## 1 ශ්‍රේණිය

විහාරාධිපති
ශාස්ත්‍රපති, තෙරිපැහැ ධම්මරුචි ස්ථවිර
පියසඳ වෙහෙර
හෝකන්දර පාර, දෙල්ගහවත්ත, පන්නිපිටිය.

සම්පාදනය හා ප්‍රකාශනය
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
2011

# දහම් පාසල

## 1 ශ්‍රේණිය


**ලේඛක මණ්ඩලය**

ශාස්ත්‍රපති පූජ්‍ය ගන්තුනේ අස්සජි හිමිපාණෝ
ශාස්ත්‍රපති පූජ්‍ය ගෝනදූවේ ගුණානන්ද හිමිපාණෝ
ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි මහතා
ශාස්ත්‍රපති ගුණසේන මහතන්ත්‍රීගේ මහතා

**සම්බන්ධීකරණය**

ජේ. පී. චමිලා රෝහිණී ජයලත් මහත්මිය

**චිත්‍ර**

එස්. එච්. රංග සමරවික්‍රම මහතා

**මුද්‍රණ කටයුතු සම්බන්ධීකරණය**

ජී. ජී. ඒ. ඩී. ඊ. සෙනෙවිරත්න මහතා



**මුද්‍රණය**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

පළමුවන මුද්‍රණය – 2006
දෙවන මුද්‍රණය – 2007
තෙවන මුද්‍රණය – 2008
සිව්වන මුද්‍රණය – 2009
පස්වන මුද්‍රණය – 2010
හයවන මුද්‍රණය – 2011



සියලු හිමිකම් ඇවිරිණි



CM 012883 – 210,000 (2011/04)

## හැඳින්වීම

දහම් පාසලේ දැනට ක්‍රියාත්මක වන ශ්‍රේණි ක්‍රමය රජයේ පාසල්හි ශ්‍රේණි ක්‍රමයට සමාන විය යුතුය යන්න දහම් පාසල් තුළින්ම මතු වූ අදහසකි. ඒ අනුව මින් ඉදිරියට දහම් පාසලේ මූලික ශ්‍රේණිය නමින් පන්තියක් නැත. එය 1 ශ්‍රේණිය නමින් හැඳින් වේ. මෙතෙක් කල් දහම් පාසලේ 1 ශ්‍රේණිය සඳහා භාවිත කළ පෙළ පොත 2006 වසරේ සිට 2 ශ්‍රේණිය පාඨ ග්‍රන්ථය බවට පත් වේ. ඒ අනුව අනෙක් ශ්‍රේණි පාඨ ග්‍රන්ථ ද වෙනස් වේ. 2006 වසරේ සිට 1 ශ්‍රේණිය සඳහා භාවිත කෙරෙන්නේ මෙම නව පාඨ ග්‍රන්ථයයි.

මෙම අලුත් පොතේ පාඩම් සකස් කර ඇත්තේ චිත්‍රයක් හා වාක්‍ය කිහිපයක් ප්‍රමාණයක් ඇතුළත් කිරීමෙනි. එහෙත් පාඩම එයට සීමා කළ යුතු නැත. චිත්‍රය හෝ චිත්‍ර කිහිපය ඇසුරෙන් ශිෂ්‍යයන් සමඟ කථා කරමින් සුදුසු පරිදි පාඩම ගොඩනැගීමට ගුරු භවතුන් උනන්දු විය යුතුය. ඒ සඳහා උපදෙස් දෙන ගුරු අත්පොතක් ද ලබා දීමට අපේක්ෂා කර ඇත.

පාඩම ගොඩ නැඟීමේ දී ගාථා, කවි රිද්මයානුකූලව ගායනා කිරීම, රංගපෑම, ආදී ක්‍රියාකාරකම්වල යෙදීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දීම අවශ්‍යය. පාඩමෙන් ලබා දෙන පණිවුඩය වඩාත් ප්‍රාණවත් ලෙසත්, සිත් ගන්නා ලෙසත්, ඉදිරිපත් කිරීමට එම ක්‍රියාකාරකම් ඉවහල් වනු ඇත.

බුදු මැදුරට, සෑ මළුවට, බෝ මළුවට සිසුන් කැඳවා ගෙන ගොස් නිවැරදි ඉරියව් වලින් සිට වන්දනාමාන කරන ආකාරය, ඒ ඒ ස්ථාන වලදී හැසිරෙන ආකාරය තේරුම් ගැනීම සඳහා ක්‍රියාකාරීව මෙහෙයවීම අවශ්‍ය බව සැලකිය යුතුය.

දහම් පාසලට මුලින්ම එන දරුවාට එය ප්‍රියජනක ස්ථානයක් ලෙස හැඟී යන අයුරින් මෙන්ම ශ්‍රද්ධාව වැඩෙන අයුරින් දහම් පාසල ප්‍රසන්න තැනක් බවට පත් කිරීමේ වගකීම ගුරුවරයා සතු වේ.

# පටුන


01. අපේ බුදුහාමුදුරුවෝ

02. සිදුහත් බෝසත් උපත

03. බුදු වීම

04. අපේ ගෙදර

05. අපේ ගෙදර සිටින අය

06. අපි තෙරුවන් වඳිමු

07. මව්පියන්ට වඳිමු

08. අපි පන්සල් යමු

09. අපේ පන්සල

10. අපේ හාමුදුරුවෝ

11. අපි දහම් පාසල් යමු

12. දහම් පාසලේ දී තෙරුවන් වඳිමු

13. අපේ පන්තිය

14. පසළොස්වක පෝය

15. මෙත් වඩමු

16. පෙරහර

17. අපේ යාළුවෝ

18. අපේ තවත් යාළුවෝ

19. හොඳ පුරුදු

20. හොඳ සිරිත්

# තේමා


| | | | | | |
|---|---|---|---|---|---|
| 01. | බුදුහාමුදුරුවෝ | - | 1 | 2 | 3 |
| 02. | අපේ ගෙදර | - | 4 | 5 | 6 |
| 03. | පන්සල | - | 8 | 9 | 10 |
| 04. | දහම් පාසල | - | 11 | 12 | 13 |
| 05. | පෝය දවස | - | 14 | 15 | |
| 06. | පෙරහර | - | 16 | | |
| 07. | යාළුවෝ | - | 17 | 18 | |
| 08. | හොඳ වැඩ | - | 19 | 20 | |

01. පාඩම

# අපේ බුදුහාමුදුරුවෝ



සාධු ! සාධු ! සාධු !

02. පාඩම

# සිදුහත් බෝසත් උපත



වෙසක් පෝය දා සිදුහත් කුමරු උපන්නා.

03. පාඩම

# බුදුවීම



වෙසක් පෝය දා බෝසත්තුමා බුදු වුණා.

04. පාඩම

# අපේ ගෙදර



අපේ අම්මා අපට ආදරෙයි

අපේ තාත්තා අපට ආදරෙයි

අපිත් අම්මටයි තාත්තටයි ආදරෙයි

05. පාඩම

# අපේ ගෙදර සිටින අය



අයියා, අක්කා, නංගී, මල්ලී
අපි ඔක්කොම එකතුවෙලා
ගෙදර ලස්සනට තබා ගනිමු.

06. පාඩම

# අපි තෙරුවන් වඳිමු



අපි හැමෝම උදේ සවස තෙරුවන් වඳිමු.

07. පාඩම

# මව්පියන්ට වඳිමු



අපි පාසල් යන්න පෙර අම්මාට තාත්තාට වඳිනවා.

අම්මයි තාත්තයි තෙරුවන් සරණයි කියනවා.

අපි රෑට නිදා ගන්නෙත් අම්මට තාත්තට වැඳලා.

08. පාඩම

# අපි පන්සල් යමු



අපි ඇඟ සෝදා පිරිසිදු වෙමු.

සුදු ඇඳුම් ඇඳ ගනිමු.

තෙල් අරගෙන මල් අරගෙන පන්සල් යමු.

09. පාඩම

# අපේ පන්සල



අපි වෙහෙර වහන්සේ වන්දනා කරමු.



අපි බෝධීන් වහන්සේ වන්දනා කරමු.



අපි බුදුපිළිම වහන්සේ වන්දනා කරමු.

10. පාඩම

# අපේ හාමුදුරුවෝ



හාමුදුරුවෝ පන්සලේ වැඩ සිටිනවා.
හාමුදුරුවෝ අපට හරි කරුණාවයි.
බණ කතා කියා දෙනවා.



හොඳ ළමයින් වෙන හැටි කියා දෙනවා.
අපි හාමුදුරුවන්ට වඳිමු.
සාධු ! සාධු ! සාධු !

11. පාඩම

# අපි දහම් පාසල් යමු



අපි උදෙන්ම නැගිට්මු.
මුහුණ සෝදා පිරිසිදු වෙමු.
සුදු ඇඳගෙන
මල් අරගෙන
දහම් පාසල් යමු.

12. පාඩම

# දහම් පාසලේ දී තෙරුවන් වඳිමු



අත් දොහොන් කරමු.
මල් වලට පැන් ඉසිමු.
මල් පූජා කරමු.
තෙරුවන් වඳිමු.

13. පාඩම

# අපේ පන්තිය



අන්න අපේ ගුරුතුමිය එනවා.
අපි ඔක්කොම නැගිටිමු.
තෙරුවන් සරණායි කියමු.




අපේ ගුරුතුමිය අපට හොඳ වැඩ කියා දෙනවා.

බණ කතා කියා දෙනවා.

14. පාඩම

# පසළොස්වක පෝය



අද පසළොස්වක පෝය දවස.
අපි ඔක්කොම සිල් අරගෙන.
සුදු පාටින් බබළනවා.

හඳ එළිය හැමතැනම පැතිරිලා.
පන්සල හරි ලස්සනයි.

15. පාඩම

# මෙත් වඩමු



අපි මෙත් වඩමු.

සියලු සත්වයෝ
නිදුක් වෙත්වා !
නිරෝගී වෙත්වා !
සුවපත් වෙත්වා !

16. පාඩම

# පෙරහර



අපි පේළි හැදෙමු.
කොඩි අරගෙන මල් අරගෙන පෙරහර යමු.



ඩෙංකුටු ඩෙංකුටු ඩෙංකුටු
අපේ ගමේ බුදු පෙරහර
සාධු ! සාධු ! සාධු !

17. පාඩම

# අපේ යාළුවෝ



තිළිණි සමන් සඳුනිකා
දුමිඳු මලිති පියුමිකා
අපි ඔක්කොම යාළුවෝ.

මේ අඹ ගෙඩිය
අපි හැමෝම
බෙදා ගෙන කමු.

18. පාඩම

# අපේ තවත් යාළුවෝ



මෙන්න අපේ තවත් යාළුවෝ.
අපි ඔවුන්ටත් ආදරෙයි.

19. පාඩම

# හොඳ පුරුදු



අපේ ගෙදරයි වත්තයි පිරිසිදුව තබා ගනිමු.
ලස්සන කර ගනිමු.

20. පාඩම

# හොඳ සිරිත්



කෑමට පෙර අත් සෝදමු.
නින්දට පෙර දත් මදිමු.
මුහුණ සෝදමු.

**දහම් පාසල් සිසුන් සඳහා**

**නොමිලයේ**

**බෙදා දීම පිණිසයි.**

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විසින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ
මුද්‍රණය කරවා පළ කරන ලදී.